## "විශ්‍රාමයට පෙර සූදානමයි - සාර්ථක වැඩිහිටි දිවියයි" විශ්‍රාම පූර්ව වැඩසටහන

## උපදෙස් මාලාව - 2026

**හැඳින්වීම :-**

නිලධාරීන් විශ්‍රාම ගැන්වීමත් සමඟ මුහුණදෙන ගැටළු නිරාකරණය කරගනිමින් වැඩිහිටි දිවිය ඵලදායි ලෙස ගත කිරීමට මඟපෙන්වීම මෙයින් අපේක්ෂා කරනු ලබයි. වයස්ගත වීමත් සමඟම වෙනස් වන ජීවිතය පිළිබඳව ඔවුන්ට පැහැදිලි කර දෙමින් විශ්‍රාම දිවියට අදාළ වන නීතිමය හා වැඩිහිටියා මුහුණ දෙන ගැටළු වැඩිහිටියාට අවබෝධ කර දෙමින් සාර්ථක වැඩිහිටි දිවියක් ගත කිරීමට අවකාශය ලබාදීම සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශයේ රැකියාවල නිරතවන පුද්ගලයන් උදෙසා "විශ්‍රාමයට පෙර සූදානමයි - සාර්ථක වැඩිහිටි දිවියයි" විශ්‍රාම පූර්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන්ගේ වැඩිහිටි ජීවිතය යහපත් දිවි පෙවතක් කිරීම මෙමඟින් බලාපොරොත්තුවන අතර ජාතික මට්ටමින් වැඩසටහන් 01ක් හා ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් 341 ක් පැවත්වීමට නියමිතය.

- **අරමුණු :-**

රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පුද්ගලික අංශයේ රැකියාවල නිරතවන පුද්ගලයන් විශ්‍රාම ගැනීමත් සමඟ ඔවුන් මුහුණ දෙන ගැටළුකාරීත්වය අවම කිරීමත්, යහපත් ලෙස සමාජ ගත කිරීමට සහ වැඩිහිටිවිය සාර්ථක කරගැනීමට මඟ පෙන්වීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන දියත් කරනු ලබයි.

- **වැඩසටහන් ක්‍රියාත්මක කිරීම :-**

❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩසටහන් එක බැගින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.
❖ වැඩසටහන සඳහා උපරිම රු .20,000.00 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දෙනු ලබයි.
❖ කොට්ඨාසය තුළ ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ සුදුසු ආයතනයක් හෝ ආයතන කිහිපයක් මේ සඳහා තෝරාගත යුතුය.
❖ ඔබ විසින් තෝරාගත් ආයතනයේ හෝ ආයතන කිහිපයක සේවය කරන වයස අවුරුදු 50 ට වැඩි විශ්‍රාම ගැනීමට ආසන්න නිලධාරින් අවම වශයෙන් 25 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගි කරවිය යුතුය. ( මීට පෙර අවස්තාවන් වල මෙම වැඩසටහනට සහභාගී නොවූ නිලධාරීන් විය යුතුය.)
❖ වැඩසටහන පැවැත්විය යුතු අවම කාලය පැය හයක් විය යුතු අතර, වැඩසටහන පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කළ යුතුය.

  - විශ්‍රාම දිවියේ ශාරිරික හා මානසික සුවය - විශ්‍රාම ගතවන පුද්ගලයන්ගේ සෞඛ්‍ය යහපත් කර ගැනීමට මඟ පෙන්වීම
  - විශ්‍රාම වැටුප්, ETF හා EPF ලබා ගැනීමට පුද්ගලික ලිපිගොනුව කෙසේ විය යුතුද? - දිගු කලක් සේවයේ නිරත වෙමින් සිටින නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනුව සකසා ගැනීමට මඟ පෙන්වීම.
  - සැලසුම් සහගත වැඩිහිටි වියක් - විශ්‍රාම ගතවන වැඩිහිටියන් යහපත් ලෙස සමාජ ගත කිරීමටත් වැඩිහිටි විය සාර්ථක කරගැනීමටත් මඟ පෙන්වීම.

❖ සම්පත් දායකයින් තෝරා ගැනීමේදී උක්ත මාතෘකා සඳහා දැනුම ඇති සුදුසු නිලධාරීන් තෝරාගත යුතු අතර ඒ සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළ නිලධාරීන්ටද අවස්ථාව ලබා දිය හැකිය.

- ❖ මෙම වැඩසටහන සඳහා ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධ රාජ්‍ය සේවා විශ්‍රාමකයින්ගේ සංගමයද සම්බන්ධ කර ගැනීමට සුදුසුය.

- ❖ මෙම වැඩසටහන සඳහා සම්පත් දායකයින් තෝරා ගැනිමේදී හා දීමනා ගෙවීමේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛන අංක 07/2025 හා 2025.03.17 අනුව කටයුතු සිදු කළ යුතුය. මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරී ( වැඩිහිටි ) / සමාජ සේවා නිලධාරී / සංවර්ධන නිලධාරී (සමාජ සේවා )මගින් සිදු කළ යුතු වේ.

- ❖ මෙම වැඩසටහන ඔක්තෝම්බර් 08 වන දිනට යෙදෙන ජාතික විශ්‍රාම දිනයට සමගාවමීව එම දිනයේ හෝ ඔක්තෝම්බර් මාසය තුළ ප්‍රථම පවත්වා අවසන් කළ යුතුය.

- **අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම**

  - ❖ මුදල් ලැබීම් කුවිතාන්සි පත (පොදු 172) මුදල් ලැබී දින 14 ක් ඇතුළත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.
  - ❖ වැඩසටහන පවත්වා අවසන් වූ වහාම ඒ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිත සවිස්තර වාර්තාව NSE/DEV/FO/ 002/I (ඇමුණුම 01) ආකෘතියට අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

## “විශ්‍රාමයට පෙර සූදානමයි - සාර්ථක වැඩිහිටි දිවියයි” විශ්‍රාම පූර්ව වැඩසටහන

## ඉල්ලීම් ආකෘති පත්‍රය -2026

1. දිස්ත්‍රික්කය :- ..................................................................................................
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..................................................................................................
3. පැවැත්වීමට අපේක්ෂිත දිනය :- ..................................................................................................
4. සහභාගීත්වය

| අනු අංකය | ආයතනය | සහභාගි වන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

4.යොජිත දළ ඇස්තමේන්තුව

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු ගත මුදල (රු) |
|---|---|---|
| 01 | සම්පත්දායක දීමනා | |
| 02 | සංග්‍රහ වියදම් | |
| 03 | වෙනත්<br>1.<br>2.<br>3 | |
| එකතුව | | |

සකස් කළේ :- .......................... නිර්දේශ කළේ :-......................... අනුමත කළේ :- .....................

විෂය භාර නිලධාරි<br>නිල මුද්‍රව

සහකාර ප්‍රාදේශීය ලේකම්/<br>පරිපාලන නිලධාරි<br>නිල මුද්‍රව

ප්‍රාදේශීය ලේකම්<br>නිල මුද්‍රව